# ලෝක ලාදුරු දිනය 2021

# "ලාදුරු පරදවමු"

වසරකට, ආසන්න වශයෙන් නව ලාදුරු රෝගීන් 2000ක් පමණ වාර්තා වේ. ශ්‍රී ලංකාවේ ලාදුරු රෝගීන්ගෙන් 5% - 10%ත් අතර ප්‍රමාණයක්, ප්‍රතිකාර සඳහා යොමු වන්නේ පියවි ඇසට පෙනෙන ආබාධිත තත්ත්ව සහිතවය. ආබාධිත තත්ව ප්‍රතිශතය ඉහළයාමට හේතුවී ඇත්තේ ප්‍රමාදවී රෝග නිශ්චය කිරීමය. එයට ප්‍රධාන හේතුව වන්නේ මහජනතාවගේ නොදැනුවත්භාවය සහ රෝගය සම්බන්ධව ඇති අනියත බියයි.

ආසන්න වශයෙන් නව රෝගීන්ගෙන් 10% අවුරුදු 15ට අඩු ළමා රෝගීන් වන අතර, හඳුනානොගත් රෝගීන්ගෙන් රෝගය බෝවන බවට මෙය සාධකයක් වේ.

ලාදුරු රෝගය හඳුනාගැනීම සහ ප්‍රතිකාර මගින් සුව කිරීම ඉතා පහසුය. ප්‍රතිකාර ලබාගන්නා රෝගීන්ගෙන් අන් අයට රෝගය බෝ නොවන බැවින් රෝගීන් වෙන් කර තැබීම අනවශ්‍ය වන අතර, ඔවුන්ට සාමාන්‍ය දිවි පෙවෙතක් ගත කළ හැකිය.

රෝගය මුලින් හඳුනාගෙන නිසි ප්‍රතිකාර ලබාදීම මගින් ඉතා හොඳ ප්‍රතිඵල ලබාගත හැකි අතර, ආබාධිතතා වලින් තොරව රෝගය සුව කළ හැකිය.

ලාදුරු රෝගය සඳහා ප්‍රතිකාර චර්ම රෝග සායන වලින් නොමිලේ ලබාගත හැකිය. චර්ම රෝග විශේෂඥ වෛද්‍යවරුන් දිවයින පුරා සේවයේ යෙදී සිටින අතර, චර්ම රෝග සේවාවන් වැඩි දියුණු කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පියවර ගෙන ඇත.

ලාදුරු ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම සඳහා ලාදුරු මර්දන ව්‍යාපාරය ගන්නා වූ උත්සාහයට මගේ සුභාශිංසනය පිරිනමමි.



**පවිත්‍රා වන්නිආරච්චි**
ගරු සෞඛ්‍ය අමාත්‍ය

ලාදුරු රෝගය යනු ලෝකයේ හඳුනාගත් රෝග අතුරින් කල් ගතවූ ඉතා පැරණි රෝගයකි. ලාදුරු බැක්ටීරියාව හඳුනාගෙන දැනට වසර සියයක් ඉක්මවා තිබේ. ලාදුරු රෝග කාරකය ව්‍යාප්ත වන්නේ ලාදුරු බැක්ටීරියාව ශරීර ගතවී සිටින පුද්ගලයන්ගෙනි. මෙය වයස් භේදයකින් තොරව ඕනෑම අයෙකුට වැළඳිය හැකි රෝගයකි. සම සහ පර්යන්ත ස්නායු පද්ධතියට මෙම රෝගයෙන් හානි සිදුවන නිසා විශේෂයෙන්ම කුඩා දරුවන්ව ලාදුරු වලින් ආරක්ෂා කර ගැනීම දෙමාපියන්ගේ සහ වැඩිහිටියන්ගේ විශාල වගකීමක් බව සඳහන් කළ යුතුමය.

වර්තමාන ලෝකයේ ලාදුරු හඳුන්වා ඇත්තේ අත හැර දමන ලද ඝර්ම කලාපීය රෝග අතරටයි. විශේෂයෙන්ම අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන්ට ලාදුරු රෝගය වැළඳීමේ අවදානම ඉතා ඉහළය. එයට හේතු ගණනාවක් පවතී. මන්දපෝෂණය, වැඩි සාමාජික සංඛ්‍යාවක් සිටින නිවාස වල වාසය කිරීම, දරුවන් රැකබලා ගැනීමේ ගැටළු ආදිය මීට හේතුවේ.

ලාදුරු රෝගය තවත් අයෙකුට පැතිරෙන්නේ අධික බැක්ටීරියා ප්‍රමාණයක් සහිත රෝගීන්ගෙනි. මෙම රෝගීන් සමඟ ඉතාම කිට්ටු දිගු කාලීන ඇසුරෙන් නිරෝගී පුද්ගලයන්ට බැක්ටීරියාව පැතිරේ. ලාදුරු බැක්ටීරියාව ශරීර ගතවී රෝග ලක්ෂණ පෙන්නුම් කිරීමට ගත වන කාලය (බීජෞෂණ කාලය) ඉතා දීර්ඝ විය හැකි අතර, එය සාමාන්‍යයෙන් අවුරුදු 05ත් පමණ විය හැකිය. රෝග ලක්ෂණ ගැන අවබෝධයෙන් සිටීමෙන් මෙම රෝගය කලින්ම හඳුනා ගත හැකි වේ.

දැන් ශ්‍රී ලංකාව පුරා සෑම දිස්ත්‍රික්කයකම ඇති චර්ම රෝග සායන වලින් ලාදුරු රෝගය සඳහා ප්‍රතිකාර ලබාගැනීම සඳහා පහසුකම් සලසා ඇති අතර, එමඟින් ලාදුරු වලින් තොර ශ්‍රී ලංකාවක් යන සංකල්පයට ඉක්මණින්ම ලඟා විය හැකි බව මම විශ්වාස කරමි.



**වෛද්‍ය එස්.එච්. මුණසිංහ**
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

ලාදුරු යනු සම සහ පර්යන්ත ස්නායු පද්ධතියට බලපෑම් කරන රෝගී තත්වයකි. ලාදුරු රෝගයේදී ස්නායු පද්ධතියට ඇතිවන බලපෑම් හේතුවෙන් ආබාධිත තත්ව හට ගනී. ලාදුරු රෝග ලක්ෂණ ගත් විට එහි රෝග ලක්ෂණ එක්තරා පරාසයක පෙන්නුම් කරයි. ඇතැම් රෝගීන්ගේ සමේ එක පැල්ලමක් ද තවත් රෝගීන්ගේ ශරීරය පුරාම විහිදුනු පැල්ලම් ගණනාවක් ද දැකිය හැකිය.

එක් එක් පුද්ගලයාගේ රෝග ලක්ෂණ අනුව ප්‍රභේද කීපයක් හඳුනා ගත හැකිය.

**1.Indeterminate Leprosy** – මෙම අවස්ථාවේදී සමෙහි ලා පැහැති පැල්ලමක් මතුවේ.

**2.Tuberculoid Leprosy-** හිරි වැටීමක් සහ සමේ පැහැයට වඩා අඩු පැහැයක් සහිත පැල්ලමක් ශරීරයේ ඕනෑම ස්ථානයක ඇතිවීම මෙහිදී සිදුවේ. මීට අමතරව පැල්ලම් ආශ්‍රිතව තිබෙන ඇතැම් ස්නායු ඝනකම් වීමේ ස්වාභාවයක් දැකිය හැකිය.

**3.Lepromatous Leprosy** – මෙහිදී ලාදුරු බැක්ටීරියාව ශරීර ගතවූ පුද්ගලයාගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය මගින් බැක්ටීරියාවට එරෙහිව කිසිදු ප්‍රතික්‍රියාවක් සිදු නොවෙයි. මේ නිසා ලාදුරු බැක්ටීරියාව ශරීරය පුරාම ගුණනය වීම සිදුවේ. මෙහිදී සිරුරේ විශාල වශයෙන් බැක්ටීරියාව පැතිර තිබිය හැකිය.

ලාදුරු මර්දන ව්‍යාපාරය මගින් වසරකට වැඩසටහන් රාශියක් ලාදුරු රෝගය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙන්ම කාර්ය මණ්ඩල අවශ්‍යතාවන්ද ලබාදීමට සෞඛ්‍ය අමාත්‍යාංශය වශයෙන් අප අවශ්‍ය පියවර ගෙන ඇති බව මෙහිලා සඳහන් කිරීම ඉතා වැදගත් වනු ඇත.



**වෛද්‍ය අසේල ගුණවර්ධන**
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය

## අපකීර්තිය, පහත් කොට සැලකීම සහ අගතිය අවම කිරීම

**ලාදුරු රෝගය බෝවන්නේ කෙසේද?**
ලාදුරු රෝගය බෝ වන්නේ බැක්ටීරියාවක් මගින් මිනිසාගෙන් මිනිසාට පමණි. ප්‍රතිකාර නොගන්නා රෝගී අයෙකුගේ කැස්සක හෝ කිවිසුමක රැඳී බැක්ටීරියාව පරිසරයට එකතු වී, ස්වසනය මගින් නිරෝගී අයෙකුට රෝගය බෝවීම සිදුවේ.

**ලාදුරු රෝග ලක්ෂණ මොනවාද?**
සමෙහි ඇතිවන ලප කැලැල් හා දෑත් දෙපා හිරිවැටීම ලාදුරු රෝග ලක්ෂණ වේ.

**අවධානයෙන් සිටින්න**


ලා පැහැති ලප


ඝන වූ ස්නායු


සම මතුපිට ගැටිති


අත් වල විකෘතිය

**මෙම රෝග ලක්ෂණ ඔබටත් තිබේ නම් ඉක්මණින් ලඟම ඇති රජයේ රෝහලේ සමේ රෝග සායනයට ගොස් නොමිලේ ප්‍රතිකාර ලබාගන්න.**

**ලාදුරු රෝගය සුව කළ හැකිද?**
ඔව්. රෝග ලක්ෂණ පහළ වූ වහාම නිසි ප්‍රතිකාර ඇරඹිහ කළ හොත් රෝගය සම්පූර්ණයෙන් සුව කළ හැකිය. ලාදුරු සඳහා කෙටිකාලීන ප්‍රත්‍යක්ෂ ඖෂධ ඇත.

**රෝග ලක්ෂණ නොසලකා හැරීම හෝ ප්‍රතිකාර නොගැනීම නිසා අත් හෝ පාද වල සුව නොවන තුවාල, ඇස් අන්ධවීම් වැනි ආබාධිතතා ඇතිවිය හැකිය.**

**කිසිසේත් ඔබ ලාදුරු රෝගයට බිය විය යුතු හෝ සැඟවී සිටිය යුතු නොවේ.**

### ලාදුරු මර්දන ක්‍රියාවලියේ විකාශනය

- **වසර 100කට පෙර** – ලාදුරු බැක්ටීරියාව හඳුනාගැනීම.
- **1708** – ලන්දේසි ජාතිකයන් විසින් හැඳල ලාදුරු රෝහල ආරම්භ කිරීම.
- **1920** – ඉංග්‍රීසි ජාතිකයන් විසින් මාන්තිවු ලාදුරු රෝහල ආරම්භ කිරීම.
- **1931** – ලාදුරු රෝගීන් පිළිබඳ ප්‍රථම සංගනණය සිදුකිරීම.
- **1954** – සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලාදුරු මර්දන ව්‍යාපාරය ආරම්භ කිරීම.
- **1970** – දිස්ත්‍රික් ලාදුරු මර්දන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පත් කිරීම.
- **1983** – බහු විධ ප්‍රතිකාර ක්‍රමය (MDT – Multidrug therapy) ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීම.
- **1990** – සමාජ අලෙවිකරණ වැඩසටහන (Social Marketing Programme) දියත් කිරීම.
- **1995** – ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව ලාදුරු රෝගය පාලනය සහ ප්‍රතිකාර සේවා සාමාන්‍ය සෞඛ්‍ය සේවාවට ඇතුළත් කිරීම.

අද දින සමරන ලෝක ලාදුරු දිනයේ "ලාදුරු පරදවමු" යන තේමාව යටතේ ලාදුරු රෝගීන් හට වන අපකීර්තිය, පහත්කොට සැළකීම සහ අගතිය අවම කිරීම පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු අතර, ඔවුන්ගේ මානසික සුවසෙත ඉහළ නැංවීම පිළිබඳවත් අප අමතක නොකළ යුතුය.

එමෙන්ම, ලාදුරු සුව කළ හැකි බවත්, කලින් රෝගය හඳුනාගැනීම සහ ප්‍රතිකාර සඳහා යොමු වීම මගින් ශරීරයට ඇතිවන ආබාධිතතා වළක්වා ගත හැකි බවත් විශේෂයෙන්ම මතක තබා ගත යුතු වේ.

"අපි සැවොම එක් වී ලාදුරු රෝගය පරදවමු"



**වෛද්‍ය නයනි සූරියආරච්චි**
ශ්‍රී ලංකා සම්බන්ධීකාරක
ෆෙයාමෙඩ් පදනම

### වත්මන් තත්වය

මුළු දිවයිනම ගත් කළ වසරකට නව රෝගීන් 2000ක් පමණ වාර්තා වේ. මින් අඩකට ආසන්න රෝගීන් සංඛ්‍යාවක් වාර්තාවන්නේ කොළඹ, ගම්පහ සහ කලුතර යන දිස්ත්‍රික්ක වලිනි. ඉන්පසු වැඩිම රෝගීන් ප්‍රමාණයක් වාර්තාවන්නේ මඩකලපුව දිස්ත්‍රික්කයෙනි. නව රෝගීන් අතුරින් 200ක් පමණ වයස අවුරුදු 15ට අඩු ළමයින් වීම අතිශය ඛේදජනක තත්වයකි.

ලාදුරු රෝගය පිළිබඳව දැනුවත් බව අඩු බැවින්, ප්‍රතිකාර සඳහා යොමුවීම ප්‍රමාද වේ. මේ නිසා ලාදුරු රෝගයෙන් ඇතිවන සංකූලතා වන, අත්පා වල ඇතිවන හිරිවැටීම් සහ අත්පා පණ නැතිවීම වැනි රෝග ලක්ෂණ සමඟ රෝහලට වාර්තාවීම සිදුවීමයි. මෙම තත්වයෙන් මිදීම සඳහා කළ හැකි වන්නේ මූලික රෝග ලක්ෂණ ඉක්මණින් හඳුනාගෙන ප්‍රතිකාර ලබාගැනීමට යොමුවීම වේ.

ලාදුරු රෝගය පිළිබඳ දැනුවත්වීම, හඳුනාගැනීම, ප්‍රතිකාර ලබාදීම සහ රෝගීන් හට පුනරුත්ථාපන වැඩසටහන් ආදී කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලාදුරු මර්දන ව්‍යාපාරයේ මූලිකත්වය යටතේ, දිස්ත්‍රික් වසංගත රෝග වේදාංඥවරුන්, දිස්ත්‍රික් ලාදුරු මර්දන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා රාජ්‍ය නොවන සංවිධානයන් හි දායකත්වය හා මැදිහත්වීම මත සිදු කරනු ලැබේ. වැඩිදුර විස්තර සඳහා ලාදුරු මර්දන ව්‍යාපාරය අමතන්න. (දුරකථන අංක 011-2958658)

**ලාදුරු රෝගය 2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාවෙන් සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට අප සියලුදෙනා එක්ව ලාදුරු රෝගීන් ප්‍රතිකාර සඳහා යොමු කිරීමට සහාය වෙමු.**



**වෛද්‍ය චම්පා ජේ. අලුත්වීර**
අධ්‍යක්ෂ
ලාදුරු මර්දන ව්‍යාපාරය



**වෛද්‍ය කපිල පියසේන**
ප්‍රජා වෛද්‍ය විශේෂඥ
ලාදුරු මර්දන ව්‍යාපාරය

මා දැනට අම්බලන්තොට ප්‍රදේශයේ කුඩා ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර, මීට වසර කිහිපයකට පෙර මාගේ ඇඟිලි හිරිවැටීමක් සමඟ කරන ලද පරීක්ෂණ මගින් ලාදුරු රෝගය වැළදී ඇති බව හඳුනාගැනීමට හැකි විය.

ලාදුරු රෝගය සඳහා ප්‍රතිකාර ගැනීමේදී, මාගේ අනන්‍යතාවය ආරක්ෂා කරමින් රජයේ රෝහලින් මා හට අවශ්‍ය සියලු වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නොමිලේම ලබාදුන් අතර, එකී උපදෙස් අකුරටම පිළිපැද, සියලු ප්‍රතිකාර නිවැරදිව ලබාගැනීමෙන් අනතුරුව ලාදුරු රෝගයෙන් මේ වන විට සම්පූර්ණ සුවය ලබා තිබීම සතුටට කරුණකි.

නිසි කළ ප්‍රතිකාර වෙත යොමුවීමෙන් මෙම රෝගය තවත් කෙනෙකුට බෝනොවන බව මාගේ පුද්ගලික අත්දැකීම වන අතර, මා හට ප්‍රතිකාර ගන්නා අතරතුර සාමාන්‍ය දිවි පෙවෙතක් ගත කිරීමටද හැකි විය. එමෙන්ම මාගේ වගකීමක් ලෙස නිවැසියන්ද පරීක්ෂාවට ලක් කරගන්නා ලදි. මෙම රෝගයට බිය නොවිය යුතු අතර, රෝග ලක්ෂණ මතු වූ විගස ප්‍රතිකාර සඳහා යොමු වීමෙන් ලාදුරු රෝගය නිසා ශරීරයට ඇති විය හැකි ආබාධිත තත්වයද මග හරවා ගත හැකිය.

**ඔබටත් සංවේදනය නොමැති ලප කැළල් ශරීරයේ ඇත්නම් සහ අත්පා හිරිවැටීම තිබේ නම් වහාම ලඟම පිහිටි රජයේ රෝහලට ගොස් පරීක්ෂා කරගන්න.**
**බිය නොවන්න. මෙම රෝගය සුව කළ හැකිය.**



**ආර්. පී. සුජිත් ධම්මික**

අනුග්‍රාහකත්වය - ශ්‍රී ලංකා ෆෙයාමෙඩ් පදනම

FAIR MED
Health for the Poorest